# මැතිවරණ කොමිෂන් සභාව
## தேர்தல்கள் ஆணைக்குழு

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය (10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய (10107)

web : www. elections.gov.lk
e-mail : info@elections.gov.lk

| | | |
|---|---|---|
| මගේ අංකය : EC/PE/2020/09<br>எனது இல. | ඔබේ අංකය :<br>உமது இல. | දිනය : 2020.03.03<br>திகதி |

*ඉතා හදිසි/ ඉතා වැදගත්*

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/ පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් /**
**පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරු/ආණ්ඩුකාරවර ලේකම්වරු/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් /**
**කොමිෂන් සභා ලේකම්වරු/ රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත,**

***පාර්ලිමේන්තු මහ මැතිවරණය - 2020.04.25***
***තැපෑලෙන් ඡන්දය දීම***

ඉදිරියේ දී පැවැත්වීමට නියමිත *පාර්ලිමේන්තු මහ මැතිවරණය* සඳහා 1981 අංක 01 දරන *පාර්ලිමේන්තු මැතිවරණ* පනතේ, 26 වගන්තියේ විධිවිධානවලට අනුව තැපෑලෙන් ඡන්දය දීම සඳහා වූ පහසුකම් ඉල්ලීමට හිමිකම් ඇති ඡන්ද හිමියන් වෙත එනම්, ඡන්ද විමසීමට අදාළ රාජකාරිවල නිරත වීම හෝ අනිවාර්යයෙන් පවත්වාගෙන යා යුතු වෙනත් අත්‍යාවශ්‍ය සේවාවල නිරතවීම හේතුවෙන් තමාට වෙන් කරන ලද ඡන්ද පොළට පෞද්ගලිකව ගොස් ඡන්දය දීමට නොහැකි වීමට ඉඩ ඇති ඡන්ද හිමියන් සඳහා තැපෑලෙන් ඡන්දය දීම සඳහා පහසුකම් සැලසිය යුතු වේ.

02. ඒ සම්බන්ධයෙන් ආයතන ප්‍රධානීන් වෙත නිකුත් කොට ඇති උපදෙස් මාලාවක් මේ සමඟ එවා ඇත. ඔබ ආයතනයේ නිලධාරීන්ගේ/සේවකයින්ගේ තැපැල් ඡන්ද ඉල්ලුම්පත් සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය සඳහා නිලධරයකු නම් කොට ඔහු මඟින් ආයතනයේ සියලුම නිලධාරීන් දැනුවත් කොට නියමිත දිනට පෙර සහතික කරන ලද තැපැල් ඡන්ද ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත යොමු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම මැනවි. ***මැතිවරණ රාජකාරීවලින් නිදහස් කර ඇති අය හැර රජයේ සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ අනෙකුත් සියලුම නිලධාරීන් තැපැල් ඡන්ද ඉල්ලුම් කළ යුතු අතර තැපැල් ඡන්ද අයදුම්කර නොතිබීම මෙන්ම අඩුපාඩු සහිතව ඉදිරිපත් කරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කර තිබීම ද මැතිවරණ රාජකාරීවලින් නිදහස් කිරීමට හේතුවක් නොවේ.***

03. පාර්ලිමේන්තුව විසුරුවා හැරීම පිළිබඳ ප්‍රකාශය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනට සතියකට පසු සති දෙකකට පෙර වූ කාල සීමාව තුළ තැපැල් ඡන්ද ඉල්ලුම්පත් අදාළ තේරීම්භාර නිලධාරීන් වෙත ලැබිය යුතු ය. ඒ අනුව ඉල්ලුම්පත් බාරගැනීම 2020.03.06 දින ආරම්භ වී 2020.03.16 දින අවසන් වේ.

ඒ අනුව ඔබගේ ආයතනයේ සේවයේ නියුතු සහ තැපැල් ඡන්ද ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් සපුරා ඇති සියලු දෙනාගේම අයදුම්පත් 2020.03.16 දින හෝ එදිනට පෙර හෝ අදාළ දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරී වෙත ලැබී තිබිය යුතු ය. එදිනෙන් පසුව තැපෑලෙන් හෝ වෙනත් ආකාරයකින් ලැබෙන සියලු අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත. එම නිසා තැපැල් ඡන්ද අයදුම් කිරීම අවසන් දිනයේ දී සහතික

කරනු ලබන තැපැල් ඡන්ද අයදුම්පත් තැපැලට යොමු කිරීමෙන් නියමිත දිනට පෙර තේරීම්භාර නිලධාරී වෙත ලැබීමේ ගැටලු ඇතිවිය හැකි බැවින් අවසන් දින 02ක තුළ දී සහතික කරන අයදුම්පත් තම කාර්යාලය පිහිටි දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත අතින් රැගෙන ගොස් භාරදීමට කටයුතු කරන ලෙස සහතික කිරීමේ නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන්නේ නම් මැනවි. එලෙස දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට භාරදෙන අයදුම්පත් අයදුම්කරුවන්ගේ ලියාපදිංචි දිස්ත්‍රික්ක අනුව වෙන්කර භාරදීමෙන් මෙම කාර්ය තවදුරටත් පහසුකරගත හැකි වනු ඇත.

04. තැපැල් ඡන්ද දායකයන්ගේ පහසුව සඳහා මැතිවරණයට වලංගු ඡන්ද හිමි නාමලේඛන 2020.03.06 දින සිට පහත සඳහන් ස්ථානවල ප්‍රදර්ශනය කිරීමට කටයුතු යොදා ඇත.

* සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල (කච්චේරිවල)
* සියලුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල
* සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල } අදාළ බල ප්‍රදේශයට අයත් වන ඡන්දහිමි නාමලේඛනය
* සියලුම ග්‍රාම නිලධාරි කාර්යාලවල

05. ඉහත සඳහන් කළ ප්‍රදර්ශන ස්ථාන අතුරින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල එම දිස්ත්‍රික්කයට අදාළව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හා ග්‍රාම නිලධාරි කාර්යාලවල එම කොට්ඨාශයට අදාළව පොත් වශයෙන් සකස් කරන ලද ඡන්ද හිමි නාමලේඛන පිටපත් ප්‍රදර්ශනයට තබා ඇත.

06. ඉහත සඳහන් ස්ථානවලට අමතරව,

* රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරස්‍රය, කොළඹ 07.
* කම්කරු දෙපාර්තමේන්තුව, කම්කරු මහලේකම් කාර්යාලය නාරාහේන්පිට, කොළඹ 05.
* අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.
* රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, 243/3/ඒ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
* තැපැල් මූලස්ථානය, ඩී.ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.
* ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, මාලිගාවත්ත.
* සෙත්සිරිපාය පළමු අදියර කාර්යාල සංකීර්ණය බත්තරමුල්ල යන කොළඹ දිස්ත්‍රික්කයේ රජයේ කාර්යාල සංකීර්ණවල ඡන්දහිමි නාමලේඛන තොරතුරු පරිගණක ආශ්‍රයෙන් අයදුම්කරුවන් වෙත ලබා දීමට කටයුතු කරනු ඇත.

07. එබැවින් සියලුම තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන්ට දිවයිනේ සියලුම දිස්ත්‍රික්කවලට අදාළ ඡන්ද හිමි නාමලේඛන විස්තර මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය හරහා තොරතුරු තාක්ෂණ සේවා (e-service) භාවිතයෙන් අයදුම්කරුවන් වෙත තොරතුරු ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා ඇත. **තැපැල් ඡන්ද දායකයින්ට ස්වකීය ලියාපදිංචියට අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා 2019 ඡන්දහිමි නාමලේඛනයේ තොරතුරු තාක්ෂණ සේවා (e-service) දිවයිනේ සියලුම තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් වෙත ලබා දීමට කටයුතු සම්පාදනය කර ඇති අතර ඒ සඳහා සියලුම තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් විසින් තම කාර්යාලයට අයත් පරිපාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස් වෙත මේ සමඟ අමුණා ඇති 1 වැනි ආකෘතිය ඉදිරිපත් කිරීමෙන් තැපැල් ඡන්දදායකයන්ට අවශ්‍ය තොරතුරු සොයා ගැනීමේ ඉ-සේවා පහසුකම ලබා ගත හැකි වේ. මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙම ඉ-සේවා පහසුකම් සලසනු ලබන්නේ තැපැල් ඡන්ද අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසන් දිනය දක්වා පමණි. එබැවින් තැපැල් ඡන්ද ඉල්ලුම්පත්‍ර භාරගැනීම ආරම්භ කිරීමට පෙර නියමිත පරිදි අයදුම්පත්‍ර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත ඉදිරිපත් කොට එම ඉ-සේවා පහසුකම ලබා ගන්නා ලෙස සියලුම ආයතන ප්‍රධානීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ**

ඉහත ප්‍රදර්ශන ස්ථාන හා තමන්ගේ සේවා ස්ථානවල සහතික කිරීමේ නිලධාරීන් වෙත ගොස් අයදුම්කරු පදිංචි දිස්ත්‍රික්කය හා හැඳුනුම්පත් අංකය ඉදිරිපත් කළ පසු තැපැල් ඡන්ද ඉල්ලුම්පත් සම්පූර්ණ කිරීමට අදාළ තොරතුරු ලබා ගත හැකිය. ජාතික හැඳුනුම්පත් අංක ඡන්දහිමි නාමලේඛනයේ සටහන්ව නොමැති අයදුම්කරුවන්ට ඡන්ද හිමි නාමලේඛන පොත් වශයෙන් ප්‍රදර්ශනය කරනු ලබන ඉහත 04හි සඳහන් කළ ස්ථානයකින් එම තොරතුරු ලබා ගැනීමට සිදුවේ.

08. තැපැල් ඡන්ද පහසුකම් ලබාගැනීම සඳහා සම්පූර්ණ කළ යුතු වන අයදුම්පත් ඡන්දහිමි නාමලේඛන ප්‍රදර්ශනය කරනු ලබන සියලුම ස්ථානවලින් සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් ලබාගත හැකි අතර , මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www. elections.gov.lk වෙතින් ද බාගත කර ගත හැකිය.

09. තවද, ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි තැපැල් ඡන්ද අයදුම්කරුවන්ට ස්වකීය අයදුම්පත්‍ර සම්පූර්ණ කිරීමට අවශ්‍ය තොරතුරු මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.elections.gov.lk වෙත පිවිස තම හැඳුනුම්පත් අංකය හා 2019 ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි දිස්ත්‍රික්කය ඇතුළත් කිරීමෙන් ද, තොරසේ නම් රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය 1919 මගින් ඇමතීමෙන් ද ලබාගැනීමට අවකාශ සලසා ඇති අතර, ඒ බව ඔබ මගින් පාලනය වන සියලුම ආයතනවල තැපැල් ඡන්ද අයදුම්කරුවන් වෙත දැනුම් දෙන්න.

10. එක හා සමාන පුද්ගල නාම පවතින හෙයින් තමන්ගේ තොරතුරු වෙනත් අයෙකු ලවා පරික්ෂා කොට තැපැල් ඡන්ද අයදුම්පත් සම්පූර්ණ කිරීමෙන් වළකින ලෙස තැපැල් ඡන්ද අයදුම්කරුවන් වෙත දැනුම් දීමට කටයුතු කිරීම වඩාත් සුදුසුය.

11. තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් පත් කිරීම සඳහා මේ සමඟ අමුණා ඇති ආකෘතිය (ඇමුණුම II) පාවිච්චි කළ යුතු අතර, අදාළ *සහතික කිරීමේ නිලධාරීන්ගේ පත්වීම් ලිපි රාජගිරිය සරණ පාරේ පිහිටි මැතිවරණ මහලේකම් කාර්යාලයට එවීමෙන් වැළකෙන ලෙසත් අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත පමණක් වහාම යැවිය යුතු බවත් දන්වා සිටිමි.* මැතිවරණ මහලේකම් කාර්යාලයට යොමු කරනු ලබන මෙවැනි කිසිදු පත්වීම් ලිපියක් නැවත දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට යොමු කිරීමට මැතිවරණ මහලේකම් කාර්යාලය කටයුතු නොකරන බව වැඩිදුරටත් දන්වා සිටිමි. යම් ආයතනයක අයදුම්කරුවන් විශාල ප්‍රමාණයක් සිටින විට සහතික කිරීමේ නිලධාරීන් කිහිප දෙනෙකු පත්කිරීම අවශ්‍ය වන අතර, පසුගිය ඡන්ද විමසීම්වල දී සහතික කිරීමේ නිලධාරීන්ගේ තොරතුරු හා ලේඛන භාවිතයෙන් මෙම පාර්ලිමේන්තු මැතිවරණය සඳහා සහතික කිරීමේ නිලධාරීන් පත් නොකරන බව වැඩිදුරටත් දන්වා සිටිමි. පසුගිය ඡන්ද විමසීම්වල දී සහතික කිරීමේ නිලධාරීන් ලෙස කටයුතු කර ඇති අත්දැකීම් සහිත නිලධාරීන්ට ප්‍රමුඛත්වයක් ලැබෙන පරිදි ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් පත්කිරීම සුදුසු වේ. කෙසේ වෙතත් තැපැල් ඡන්ද සලකුණු කිරීම දින දෙකකට සීමා කරන බැවින් එක් නිලධරයකු සඳහා උපරිම වශයෙන් තැපැල් ඡන්ද 200 – 250 ක් පමණ සහතික කිරීමට පැවරීම සුදුසුය.

12. තැපැල් ඡන්ද පාවිච්චි කිරීමේ දිනයට පෙර රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීමට, විදේශගත වීමට නියමිත නිලධාරීන්, සහතික කිරීමේ නිලධාරීන් වශයෙන් පත් කිරීමෙන් වැළකී සිටිය යුතු ය.

13. තැපැල් ඡන්ද සහතික කරන නිලධාරීන්ට තමන් විසින් සහතික කරන ලද අයදුම්කරුවන්ගේ ලේඛනයක් (ඇමුණුම III) පවත්වාගෙන යන ලෙස උපදෙස් ලබා දිය යුතු අතර, තැපැල් ඡන්ද ඉල්ලුම්පත් සහතික කළ පසු ඒවා පිළිගත් / ප්‍රතික්ෂේප කළ බව දැන්වීම හා පිළිගත් තැපැල් ඡන්ද අයදුම්කරුවන් වෙත ඡන්ද පත්‍රිකා අඩංගු පැකැට්ටු එවීම සඳහා සහතික කිරීමේ නිලධාරීන්ගේ නම, තනතුර, කාර්යාල ලිපිනය (අනිවාර්යයෙන්ම නිල මුද්‍රාව මගින්) ඉල්ලුම් පත්‍රයෙහි සටහන් කරන ලෙසද උපදෙස් ලබා දෙන්න.

14. නිවැරදිව සම්පූර්ණ කර ඇති තැපැල් ඡන්ද අයදුම්පත්වල තොරතුරු නිවැරදි බවට නිසැක වී සහතික කිරීමේ නිලධාරි විසින් සහතික කිරීමෙන් පසුව ඒවා නියමිත දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත යැවිය යුතු ය. එසේම එක් අයදුම්කරුවෙක් සඳහා අයදුම්පත් 1කට වැඩි ගණනක් නිර්දේශ කිරීම හා ව්‍යාජ තොරතුරු ඇතුළත් අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් වළකින ලෙස ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනු ලැබේ. ඒ ඒ දිස්ත්‍රික්කවල තැපැල් ඡන්ද අයදුම්පත් ඉදිරිපත් කළ යුතු තේරීම්භාර නිලධාරීන්ගේ කාර්යාලයීය ලිපින දැක්වෙන ලේඛනයක් මේ සමඟ ඇමුණුම IV ලෙස යාකර එවා ඇත.

තැපැල් ඡන්ද අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා තොරතුරු ලබා ගැනීම, ඒවා ඉදිරිපත් කිරීම හා සහතික කිරීමේ නිලධාරීන් පත්කිරීමට අදාළ කරුණු පමණක් මෙම චක්‍රලේඛයේ අඩංගු අතර තැපැල් ඡන්ද ක්‍රියාවලියට අවැසි සෙසු උපදෙස් හා කාර්ය පටිපාටි සහතික කිරීමේ නිලධාරීන් වෙනුවෙන් ඉදිරියේ දී පවත්වනු ලබන උපදෙස් ලබාදීමේ සාකච්ඡාවල දී ලබා දෙනු ඇත. තේරීම්භාර නිලධාරි විසින් පවත්වනු ලබන උපදෙස් පන්ති සඳහා සහතික කිරීමේ නිලධාරීන් සහභාගිවීම අත්‍යවශ්‍ය බව ඔවුනට දැනුම් දීමට කටයුතු කරන ලෙසද දන්වා සිටිනු රිසියෙමි.

මහින්ද දේශප්‍රිය
සභාපති- මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)

පිටපත්

| | | |
|---|---|---|
| 01. සියලුම තේරීම් භාර නිලධාරීන් | - | දැන ගැනීම හා දිස්ත්‍රික්කයේ රාජ්‍ය ආයතන දැනුම්වත් කිරීම පිණිස. |
| 02. සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය /සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත | | |
| 03. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් වෙත | - | දැන ගැනීම පිණිස |


සභාපති
தவிசாளர்

දුරකථන/தொலைபேசி : 011-2868444
ෆැක්ස්/ தொலைநகல் : 011-2868445
e-mail : comelesl@sltnet.lk

ලේකම
செயலாளர்

දුරකථන/தொலைபேசி : 011-2868406
ෆැක්ස්/தொலைநகல் : 011-2868406
e-mail : admin@elections.gov.lk

අධ්‍යක්ෂ (පර්යේෂණ හා ක්‍රමසම්පාදන)
பணிப்பாளர் (ஆராய்ச்சி மற்றும் திட்டமிட

දුරකථන/தொலைபேசி : 011-2877618
ෆැක්ස්/தொலைநகல் : 011-2877618
e-mail :channa@elections.gov.lk

ඇමුණුම I

**පාර්ලිමේන්තු මැතිවරණය - 2020**

**තැපැල් ඡන්ද අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා 2019 වර්ෂයේ ඡන්දහිමි නාම ලේඛන ඉ-සේවාව ලබා ගැනීම සඳහා අයදුම්පත**

1. අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ආයතනය කලාප අධ්‍යාපන කාර්යාලය/ විද්‍යාලයය :- ..........................................................................

2. කාර්යාලයීය ලිපිනය :- ..........................................................................

..........................................................................

..........................................................................

2.1. දුරකථන අංක :- .......................................... 2.2. ෆැක්ස් අංකය :- ..................................

3. කාර්යාලය අයත් දිස්ත්‍රික්කය :- ..........................................................................

4. කාර්යාලය අයත් ඡන්ද ප්‍රදේශය :- ..........................................................................

5. ඉ - තැපැල් ලිපිනය :- ..........................................................................

6. ආයතනයේ තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරියාගේ විස්තර (නිලධාරින් එක් අයෙකුට වැඩිනම් වෙනවෙනම තොරතුරු පත්‍රිකා පිරවීම අවශ්‍යය)

(I) නම :- ..........................................................................

(II) තනතුර :- ..........................................................................

(III) ජාතික හැඳුනුම්පත් අංකය:- ..........................................

(IV) දුරකථන අංක

කාර්යාලය :- ..........................................................

ජංගම :- ..........................................................

ෆැක්ස් :- ..........................................................

(V) ඉ - තැපැල් ලිපිනය :- ..........................................................

ඉහත සඳහන් කළ තොරතුරු සත්‍ය බවත්, ලබාගන්නා ඡන්දහිමි නාමලේඛන තොරතුරු තැපැල් ඡන්ද අයදුම්පත්‍ර සම්පූර්ණ කිරීමේ කාරණය හැර වෙනත් කිසිදු කටයුත්තක් සඳහා භාවිතා නොකරන බවට (අවභාවිතා නොකරන බවට) සහතික කොට ප්‍රකාශ කරමි.

........................................
දිනය

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන

නම හා නිල මුද්‍රව

---

මැතිවරණ කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා

අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ)

ඉ - සේවාව හා මුර පදය ලබාදීම අනුමත කරමි.

........................................
දිනය

..........................................................
නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්

PE/2020/34/01/F1 ඇමුණුම II

(ආදර්ශය)

කාර්යාල ලිපිනය - ............................................

............................................

............................................

............................................

දිනය - -20....../......./.....

තේරීම්භාර නිලධාරී,

..................................... මැතිවරණ කොට්ඨාසය

**පාර්ලිමේන්තු මැතිවරණය - 2020**

**තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් පත් කිරීම**

01. (අ) තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධරයාගේ නම ................................................................................

(ආ) ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

02. තනතුර - .........................................................................................................................

03. (අ) සහතික කිරීමේ නිලධරයාගේ කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය - ........................................................

(ආ) රාජකාරී ලිපිනය - ..................................................................................................

(ඇ) රාජකාරී දුරකථන අංකය - ............................... (ඈ) ෆැක්ස් ...... ......................... (ඉ) ඉ-තැපැල ........ ..........

04. (අ) පෞද්ගලික ලිපිනය - ..................................................................................................

(ආ) දුරකථන අංක (ජංගම) - ..................................................................................................

05. නිලධරයාගේ ආදර්ශන අත්සන - ..................................................................................

තැපැල් ඡන්ද අයදුම්පත්වල
තබන නිල මුද්‍රාවේ ආදර්ශය
ඉදිරි කොටුව මත තබන්න

| |
|---|
| |

06. තැපැල් ඡන්ද සහතික කරන්නේ කුමන ආයතනයක/ කාර්යාලයක/ තැපැල් ඡන්ද දායකයන් සම්බන්ධයෙන් ද යන වග - ..................................................................................

07. තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරී වශයෙන් ඉහත නිලධාරී තැන දළ වශයෙන් කොතරම් තැපැල් ඡන්ද දායකයින් ප්‍රමාණයකට (සංඛ්‍යාවකට) අදාළව මෙම රාජකාරී ඉටු කරන්නේ ද යන වග -

..................................................................................................

08. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය -

ඉහත විස්තර සඳහන් නිලධාරී තැන .................................................................. ඡන්ද විමසීම වෙනුවෙන් තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධරයෙකු වශයෙන් මෙයින් පත්කරමි. ඔහුට/ඇයට අදාළ රාජකාරී සම්බන්ධයෙන් ඔහු/ඇය දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බවත් මෙයින් දන්වමි.

තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරී පත්කරනු ලබන නිලධාරියාගේ නම - ..............................................

ජාතික හැඳුනුම්පත් අංකය - .............................................

තනතුර - .............................................

දුරකථන අංක - කාර්යාලය: ......................... ජංගම:......................... ෆැක්ස්:.........................

ඉ-තැපැල : .............................

අත්සන - .............................................

නිල මුද්‍රව - .............................................

ඇමුණුම I

# පාර්ලිමේන්තු මැතිවරණය - 2020

## තැපැල් ඡන්ද ඉල්ලුම් කිරීම පිළිබඳ තොරතුරු

| අනු අංකය | තැපැල් ඡන්දදායකයාගේ නම | තනතුර | රාජකාරි ලිපිනය | සහතික කිරීමේ නිලධාරී වෙත තැපැල් ඡන්ද අයදුම් පත්‍ර ඉදිරිපත් කළ දිනය | තැපැල් ඡන්ද ඉල්ලුම්පත් අදාල තේරීම්භාර නිලධාරී වෙත යවන ලද දිනය | තැපැල් ඡන්ද හිමියෙකු වශයෙන් ලියාපදිංචි වී ඇති පරිපාලන දිස්ත්‍රික්කය | තැපැල් ඡන්දදායකයා ලියාපදිංචියට අදාළ විස්තර | | | | තේරීම්භාර නිලධාරී විසින් අයදුම්පත්‍ර පිළිගත් බව / ප්‍රතික්ෂේප කළ බව දන්වා ඇත්නම් ඒ තීරණ ලිපියේ විස්තර | [illegible] |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | මැතිවරණ කොට්ඨාසය | ඡන්ද ප්‍රදේශය | ඡන්ද කොට්ඨාස අංකය | පිළිවෙළ අංකය | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |

ඇමුණුම IV

## තැපැල් ඡන්ද අයදුම්පත් ඉදිරිපත් කළ යුතු දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කාර්යාල

| | ලිපිනය | | දුරකථන අංක | | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ෆැක්ස් අංකය |
|---|---|---|---|---|---|
| | | | දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | |
| 01 | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | "නිලමැඳුර", නාරාහේන්පිට,කොළඹ 05. | 0112369134 | 011-2369437<br>011-2369438<br>(දිස්ත්‍රික්) | 011-2369279<br>011-2369481<br>(දිස්ත්‍රික්) |
| 02 | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | ගම්පහ | 0332222841 | 033-2222047 | 033-2223462 |
| 03 | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | කළුතර | 0342222235 | 034-2222266 | 034-2222247 |
| 04 | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | මහනුවර | 0812222233/35 | 081-2233187 | 081-2233190 |
| 05 | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | මාතලේ | 0662222236 | 066-2222422 | 066-2230401 |
| 06 | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | නුවරඑළිය | 0522222235 | 052-2222325 | 052-2222066 |
| 07 | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | ගාල්ල | 0912234235 | 091-2234028 | 091-2234018 |
| 08 | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | මාතර | 0412222235 | 041-2222305 | 041-2244645 |
| 09 | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | හම්බන්තොට | 0472256235 | 047-2256248 | 047-2256495 |
| 10 | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | යාපනය | 0212222235 | 021-2222655 | 021-2228002 |
| 11 | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | කිළිනොච්චිය | 0212283965 | 021-2285664 | 021-2283819 |
| 12 | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | වවුනියාව | 0242222235 | 024-2222311 | 024-2228911 |
| 13 | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | මන්නාරම | 0232222235 | 023-2222289 | 023-2223710 |
| 14 | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | මුලතිව් | 0212290035 | 021-2061426 | 021-2061427 |
| 15 | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | මඩකලපුව | 0652224435 | 065-2224312 | 065-2224374 |
| 16 | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | අම්පාර | 0632222206 | 063-2224342 | 063-2224342 |
| 17 | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | ත්‍රිකුණාමලය | 0262222235 | 026-2222304 | 026-2224975 |
| 18 | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | කුරුණෑගල | 0372222235 | 037-2222369 | 037-2221549 |
| 19 | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | පුත්තලම | 0322265235 | 032-2265246 | 032-2265302 |
| 20 | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | අනුරාධපුර | 0252235479 | 025-2222551 | 0252226440 |
| 21 | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | පොළොන්නරුව | 0272222235 | 027-2222012 | 027-2057320 |
| 22 | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | බදුල්ල | 0552222235 | 055-2222424 | 055-2225222 |
| 23 | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | මොණරාගල | 0552276235 | 055-2276315 | 055-2276291 |
| 24 | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | රත්නපුර | 0452222235 | 045-2222023 | 045-2221905 |
| 25 | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | කෑගල්ල | 0352222235 | 035-2222561 | 035-2232003 |